


# සමඟිය බලය වේ.





M.A ආකර්ෂා සෞම්‍යා

# සමගිය බලය වේ.

M.A ආකර්ෂා සෞම්‍යා

කතා

මහ/මහාමායා බාලිකා විදුහල

5 ශ්‍රේණිය A

ISBN - 978-624-211-240-4

# පිදුම

## මෙලොවට මා බිහිකළ

## දෙගුරුන්ට

## සහ

## මා යහමගට යවන

## ගුරු මෑණිවරුන්ට සහ පියවරුන්ට



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# <u>සුභාශිංසන පණිවුඩය</u>

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා භාරිකාව විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# පටුන



- පිදුම
- පෙරවදන
- සුභාශිංසන පණිවිඩය
- කතාව

ඔන්න එකමත් එක කැළයක

වලස් පවුලක් සහ ඉත්තෑ පවුලක් හිටියා.

මේ පවුල් දෙක හරිම තරහකාරයෝ.


හරියට නයයි මුගටියයි වගේ.



ඉතිං මේ පවුල් දෙකේම පුංචි පැටවුන් හිටියා.

හැබැයි ලොකු අය රණ්ඩු වුනාට එයාලා නම් රණ්ඩු

වුනේ නෑ.එයාලා හරිම සමගියෙන් තමයි හිටියේ.




නමුත් මේ බව දැනගත්තා වලස්රාල.

එයා කැමති වුණේ නෑ එයාගේ පැටවු

ඉත්තෑ පැටවු සමග සමගියෙන් සෙල්ලම් කරනවාට.

එයා මේ ගැන වලස් හාමිනේට කිව්වා.





"හාමිනේ බලන්නකෝ අපේ පැටවු අර

ඉත්තෑවන් එක්ක සෙල්ලම් කරන්න යනවා.

අපි තරහාකාරයොත් එක්ක එයාලා සෙල්ලම් කරනවා.

මම නම් හරි අකැමතියි."වලස්රාළ කීවා.




ඒක නම් ඇත්ත තමා

මේ අපි අර ඉත්තෑවන්ට ගිහින් කියමු.

ඒ පැටවු අපේ පැටවු එක්ක

සෙල්ලම් කරන්න එවන්න එපා කියලා



මේ වලස්රාළයි, වලස් හාමිනේයි ගියා

ඉත්තෑරාළව හමුවෙන්න.

"ආ..... ඉත්තෑරාළේ බහිනවා එළියට

ඔයගොල්ලො කොච්චර කිව්වත් අහන්නේ නෑ නේද?

මේ පැටවු අපේ වත්තට එවන්න එපා කියලා."



ඇයි වලස්රාළේ ඔයාලාගේ පැටවුන්

අපේ ගෙදර ඇවිල්ලා හොඳට සෙල්ලම් කරලා

යන්නේ ඔයාගේ පැටවුනුත් අපේ වත්තට එවන්න එපා.

මොකද අපිට පිස්සුවකුත් නෑ

තරහාකාරයොන්ගේ පැටවු ගෙට වද්දා ගන්න.

මෙයාලා මෙහෙම හොඳටම රණ්ඩු වෙලා ගෙදර ගියා.



කොච්චර දෙමාපියන් රණ්ඩු කළත්

මේ පුංචි පැටවු ආයෙත් වත්තට ඇවිත් සෙල්ලම් කළා.

හරිම සමගියෙන් දවස ගත කළා.

එක දවසක් වලස් රාළ

මෙයාලා සෙල්ලම් කරන දිහා හොරෙන් බලාගෙන හිටියා.



"අපේ පුංචි පැටවු කොච්චර සමගියෙන් ඉන්නවද?".

වලස්රාළ හිතුවා.

වලස්රාළ හාමිනේටත් එන්න කිව්වා

පැටවු සමගියෙන් සෙල්ලම් කරනවා බලන්න.

මේක දැකපු හාමිනේ

" අනේ බලන්න අපි කොච්චර රණ්ඩු වුණත්

එයාලා කවදාවත් රණ්ඩු උනේ නැහැ.

වලස්රාළ මටත් දැන් තේරෙනවා

අපි මොකටද බොරුවට අර ඉත්තෑරාළත්

එක්ක තරහා වෙලා ඉන්නේ" කියලා හාමිනේ කිව්වා.



“ඒක නම් ඇත්ත හාමිනේ” වලස් රාළ කිවා.
හවස වලස් රාළයි වලස් හාමිනේයි ගියා
ඉත්තෑරාළ ලාගේ ගෙදරට
“අනේ අපට සමාවෙන්න ඉත්තෑරාළ
අපි හැමදාම තරහා වුනා කියලා
අපිට මොනවද ලැබෙන්නේ අපේ පැටවු තමා
අපට මේ පාඩම කියලා දුන්නේ.”වලස් රාළ කිව්වා.
“අනේ ඔව් මමත් අපේ හාමිනේට කියා කියා හිටියේ
ආයෙමත් තරහ නැතුව යාළුවෙමු කියලා.”
ඉත්තෑරාල කීවා.ඒක හොඳයි.
“අපි අද ඉදන් හොඳ අසල්වැසියෝ වෙමු.”
එදා ඉදන් මේ වලස් පවුලයි, ඉත්තෑ පවුලයි
හරි සතුටින් ජීවත් වුණා.





## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

**ISBN- 978-624-211-240-4**